# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,881 - 2014 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාදා - 2014.09.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1636 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1637 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1641 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1644 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1645 |


*සැ. යු.* - ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත 2014 අගෝස්තු මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 සැප්තැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - පොළොන්නරුව**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයෙන් රාජසන්තක කරන ලද පහත සඳහන් රථ වාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට පොළොන්නරුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. විකිණීමට අදාළ රථ වාහන පහතින් දක්වා ඇති ස්ථානයේ දී 2014.09.19 වැනි දිනට පසු අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි පොළොන්නරුව මහාධිකරණය මගින් 2014.09.19 වැනි දින සිට 2014.10.03 දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන ලද රු. 100 ක පෝරම ගාස්තුවක් පොළොන්නරුව මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව යතුරු පැදිය සඳහා රු. 5,000 ක සහ අනිකුත් රථ සඳහා එක් එක් රථයට රු. 7,000 බැගින් ආපසු ගෙවන තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අතිකුත් විස්තර සහ කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග සපයනු ලැබේ.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *පරීක්ෂා කළ හැකි ස්ථානය* | *පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගත යුතු නිලධාරියා* |
|---|---|---|---|---|
| 01. | 56527 | අංක 226-9177 දරන ඇට්ලස් ලොරි රථය | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හිඟුරක්ගොඩ | රෙජිස්ට්‍රාර් දිසා/මහෙස්ත්‍රාත් හිඟුරක්ගොඩ |
| 02. | 19210 | අංක 68-8207 දරන ටොයොටා ලොරි රථය | එම | එම |
| 03. | නඩු අංක රහිත | අංක NCVI -4310 දරන බජාජ් ඩිස්කවරි යතුරු පැදිය | එම | එම |
| 04. | 59535 | අංක 32-8363 දරන මිට්සුබිසි පෙජරෝ රථය | එම | එම |
| 05. | 9551 | මිට්සුබිසි ජීප් රථය | එම | එම |

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
පොළොන්නරුව.

2014 අගෝස්තු මස 25 වැනි දින,
පොළොන්නරුව මහාධිකරණයේ දී ය.

09-509

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**"ෂොක් ඇබ්සෝබර් ටෙස්ටින් මැෂින්" එකක් ස්ථාපනය කොට ක්‍රියාත්මක කර පෙන්වීමේ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක SRS/F.7080

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත "ෂොක් ඇබ්සෝබර් ටෙස්ටින් මැෂින්" එකක් සපයා ස්ථාපනයකොට ක්‍රියාත්මකකොට පෙන්වීම සඳහා කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ තැ. පෙ. අංක 355 හි දුම්රිය මූලස්ථානයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් නිෂ්පාදකයින්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. 2014.09.26 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන රු. 2,500 ක් පමණක් වූ ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් 2014.09.25 වැනි දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත් මත සටහන් කළ ලංසු පමණක් භාරදිය යුතු යි.

04. ශ්‍රී ලංකාව කොළඹ 10, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ලංසු භාරගැනීම අවසන් කළ වහාම එම ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙන විත් පහත දැක්වෙන ලිපිනයට භාර දිය යුතුයි.

සභාපති තැන,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිමනත් විස්තර සඳහා කරුණාකර පහත ලිපිනය ආමන්ත්‍රණය කරන්න. දුම්රිය ගබඩා අධිකාරි, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංක : 94 (11) 2432044
ඊමේල් : sras.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංක SRS/F. 7080

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

09-515

# බඩු බාහිරාදිය විකිණීම්

**පොලිස් දෙපාර්තමේන්තුව - කන්කසන්තුරය කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ කන්කසන්තුරය කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවලට පාවිච්චි කර ගර්හිත කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2014 සැප්තැම්බර් මස 24 වැනි දින පැය 10.00 ට කන්කසන්තුරය පොලිස් ස්ථාන භූමියේ දී පැවැත්වේ.

තම අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසු 2014 සැප්තැම්බර් මස 23 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේ ම අත්පිට මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතු ය. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ 2014 සැප්තැම්බර් මස 24 වැනි දින පැය 16.00 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු ය. එසේ ඉවත් කර ගැනීමට අපොහොසත් වන භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
කන්කසන්තුරය කොට්ඨාසය.

**භාණ්ඩ උපලේඛනය**

| *අනු. අංකය* | *භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | ඩී. වී. ඩී. ප්ලේයර් | 03 |
| 02. | ඩී. වී. ඩී. දුරස්ථ පාලක | 04 |
| 03. | වී. ඩී. ඕ. යන්ත්‍ර | 03 |
| 04. | පරිගණක දත්ත ලියවන | 07 |
| 05. | යූ. පී. එස්. බැටරි | 03 |
| 06. | පරිගණක ප්‍රින්ටර් | 07 |
| 07. | ෆොටෝ කොපි මැෂින් | 05 |
| 08. | රූපවාහිනී යන්ත්‍ර | 05 |
| 09. | පරිගණක කී බෝඩ් | 02 |
| 10. | කැසට් රේඩියෝ | 40 |
| 11. | කුඩා රේඩියෝ | 60 |
| 12. | ඇල්කාටෙල් දුරකථන | 03 |
| 13. | ඩිජිටල් ස්පීකර් ෆෝන් | 01 |
| 14. | උදලු තල | 21 |
| 15. | දුරකථන කූට් | 01 |
| 16. | මල් කපන කතුරු | 01 |
| 17. | ලන්තෑරුම් | 03 |
| 18. | ඩැගන් ටොච් හා බැටරි | 31 |
| 19. | ටියුබ් ලයිට් සෙට් | 112 |

| අනු අංකය | භාණ්ඩ | ප්‍රමාණය | අනු අංකය | භාණ්ඩ | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 20. | ටෝච් ලයිට් | 73 | 77. | බිත්ති ඔරලෝසු | 18 |
| 21. | පෙට්‍රල් මැක්ස් | 07 | 78. | මේසන් හැදි | 03 |
| 22. | හැලජන් ලාම්පු | 103 | 79. | වතුර පිල්ටර් | 02 |
| 23. | ඉමර්ජන්සි ලයිට් | 11 | 80. | යකඩ දම්වැල් කැබලි | 01 |
| 24. | ටියුබ් ලයිට් චෝක් | 24 | 81. | යකඩ කුෂන් පුටු කැබලි | 94 |
| 25. | ටේබල් ෆෑන් | 19 | 82. | යකඩ පුටු කැබලි | 104 |
| 26. | ස්ටෑන්ඩ් ෆෑන් | 07 | 83. | සවල් | 01 |
| 27. | වානේ යකඩ කබඩ් | 07 | 84. | විධායක පුටු කැබලි | 01 |
| 28. | සිවිලින් ෆෑන් | 66 | 85. | රේක්ක | 21 |
| 29. | විල්බැරෝ | 14 | 86. | බ්ලෙන්ඩර් | 09 |
| 30. | සවල් | 07 | 87. | ගිනි නිවන උපකරණ | 02 |
| 31. | උදලු තල | 28 | 88. | ඇලුමිනියම් පිඟන් | 58 |
| 32. | සිවිලින් ෆෑන් තටු | 09 | 89. | ඇලුමිනියම් ජෝග්ගු | 77 |
| 33. | වතුර ෆිල්ටර් | 31 | 90. | ඇලුමිනියම් කොරෝස් | 14 |
| 34. | බොයිලේරු | 22 | 91. | ගෑරුප්පු | 02 |
| 35. | මල්ටි පොට් | 17 | 92. | බාල්දි ලොකු | 15 |
| 36. | ටීවොමර් | 01 | 93. | බාල්දි කුඩා | 58 |
| 37. | වතුර ටැංකි | 06 | 94. | මෙස් ටින් | 432 |
| 38. | බූස්ටර් | 06 | 95. | ගෑස්ලිප් | 59 |
| 39. | තරාදි | 02 | 96. | ගෑස් සිලින්ඩර් 12.5 | 14 |
| 40. | විදුලි කේතල | 30 | 97. | විදුලි හිරමණ | 12 |
| 41. | විදුලි ස්ත්‍රික්ක | 05 | 98. | ඇන්ටනා | 23 |
| 42. | විදුලි වතුර මෝටර් | 25 | 99. | හිරමනා | 13 |
| 43. | තණකොළ කපන මැෂින් | 04 | 100. | සාස්පාන | 14 |
| 44. | අධි ශීතකරණ | 08 | 101. | යතුරු ලියන ඉංග්‍රීසි | 16 |
| 45. | තෙල් හැදි | 07 | 102. | යතුරු ලියන දෙමළ | 12 |
| 46. | අධිශීතකරණ පවර් ගාර්ඩ් | 02 | 103. | යතුරු ලියන සිංහල | 21 |
| 47. | ෆැක්ස් යන්ත්‍ර | 12 | 104. | ටැකර්ලයිට් | 02 |
| 48. | ටිප්ස් ස්විච් | 03 | 105. | ඇලුමිනියම් මුට්ටි | 18 |
| 49. | කැල්කියුලේටර් | 30 | 106. | දොර ලොක් | 03 |
| 50. | හීටර් | 10 | 107. | මේස ලාම්පු | 01 |
| 51. | මල් බාල්දි | 06 | 108. | පංචර් | 19 |
| 52. | පීකස් | 19 | 109. | රෝනියෝ යන්ත්‍ර | 01 |
| 53. | කොන්ඩ කපන මැෂිම | 01 | 110. | පවගාඩ් | 06 |
| 54. | කල්දේරම් අඟල් 16 | 53 | 111. | චේන්සෝ | 01 |
| 55. | කල්දේරම් අඟල් 24 | 32 | 112. | ටකරන් කැබලි | 30 |
| 56. | කල්දේරම් අඟල් 30 | 12 | 113. | ස්ටැබ් ලයසිර් | 02 |
| 57. | කල්දේරම් අඟල් 32 | 12 | 114. | තේ හැදි | 04 |
| 58. | කල්දේරම් අඟල් 21 | 17 | 115. | වොඩ් රෙබිස් | 01 |
| 59. | තාච්චි | 05 | 116. | බැටරි | 03 |
| 60. | කල්දේරම් අඟල් 12 | 12 | 117. | දොර හැඩල් | 01 |
| 61. | මාලු කපන පිහියා | 08 | 118. | කොන්ඩ් පට්ටම් | 01 |
| 62. | බත්හැදි | 06 | 119. | පාපැදි ස්ටෑන්ඩ් | 04 |
| 63. | ස්ටෙපර් මැෂින් | 23 | 120. | පාපැදි බෙල් | 02 |
| 64. | රයිස් කුකර් | 01 | 121. | පාපැදි ලොක් | 01 |
| 65. | දුරකථන | 03 | 122. | කියත් | 01 |
| 66. | ඇන්ටනා වයර් කැබලි | 17 | 123. | මුල්ලු | 14 |
| 67. | නාන කාමර තරාදි | 01 | 124. | පරිගණක පුටු | 01 |
| 68. | පාපැදි | 46 | 125. | පිහිය කැති | 33 |
| 69. | පාපැදි රිම් | 02 | 126. | ඉබි යතුරු | 38 |
| 70. | පාපැදි යතුරු | 01 | 127. | සීනු | 03 |
| 71. | පාපැදි සීට් | 01 | 128. | විසිකැති | 40 |
| 72. | පාපැදි ඩයිනමෝ | 06 | 129. | මන්නා පිහි | 12 |
| 73. | පාපැදි සීනු | 02 | 130. | වැකුම් කිලිනර් | 02 |
| 74. | පාපැදි හුලං පොම්ප | 06 | 131. | කොන්ටෝසින් කම්බි රෝල් | 04 |
| 75. | පොරෝ තල | 09 | 132. | මැග් ටොච් | 02 |
| 76. | කටු කම්බි කැබලි | 03 | 133. | සර්ට් ලයිට් | 03 |

| අනු අංකය | භාණ්ඩ | ප්‍රමාණය |
|---|---|---|
| 134. | කටර් අඩු | 02 |
| 135. | පේපර් කටර් | 01 |
| 136. | ඇලුමිනියම් බකට් | 08 |
| 137. | බූස්ටර් | 01 |
| 138. | අයන් බෝඩ් | 01 |
| 139. | ඩෙක් යන්ත්‍ර | 01 |
| 140. | ඩ්‍රැගන් ලයිට් | 01 |
| 141. | වායු සමීකරණ | 01 |
| 142. | පාන් තැටි | 02 |
| 143. | පාන් අච්චු | 09 |
| 144. | තෙල් ඉසින ටැංකි | 03 |
| 145. | අලවංගු | 06 |
| 146. | ස්ටූල් | 03 |
| 147. | බැරට් සෙට් | 01 |
| 148. | බැරට් පවර් සප්ලයි යුනිට් | 01 |
| 149. | බැට් ඩයිපොට් ඇන්ටනා | 01 |
| 150. | බැ 612 වොල්ට් 70 බැටරි | 01 |
| 151. | පොඩර් | 10 |
| 152. | විදුලි යතුරු ලියන | 02 |
| 153. | ඇලුමිනියම් කප් | 06 |
| 154. | ඇලුමිනියම් නැඹිලි | 05 |
| 155. | ඇල්කටින් බට කැබලි | 100 |
| 156. | ස්ටීමර්ට් | 03 |
| 157. | පෙෂර් කුකර් | 01 |
| 158. | ගෑස් කුකර් | 03 |
| 159. | මයික්ස්ටෑන්ඩ් | 01 |
| 160. | ඇම්පිපයර් | 01 |
| 161. | කැමරා ප්ලෑසර් | 01 |
| 162. | වායු සමීකරණ යන්ත්‍ර | 01 |
| 163. | ඉදිආප්ප වංගෙඩි | 02 |
| 164. | කැමරා | 01 |
| 165. | ස්කැනර් මැෂින් | 01 |
| 166. | පුටු වැල් | 01 |
| 167. | රෙදි කපන කතුරු | 02 |
| 168. | යකඩ කුෂන් පුටු | 05 |
| 169. | සිටිලින්ක් දුරකථන | 01 |
| 170. | බ්ලෙන්ඩර් | 01 |
| 171. | ගණක යන්ත්‍ර | 01 |
| 172. | ගිනි නිවන උපකරණ | 01 |
| 173. | කවපෙති | 02 |
| 174. | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 175. | යතුරු ලියන ඉංග්‍රීසි | 02 |
| 176. | ඇලුමිනියම් හැඳි | 06 |
| 177. | තේ හැඳි | 03 |
| 178. | මේස හැඳි | 10 |
| 179. | ඇලුමිනියම් තාච්චි | 02 |
| 180. | සාස්පාන් සෙට් | 02 |
| 181. | පොරෝ තල | 02 |
| 182. | කල්දේරම් | 06 |
| 183. | යකඩ බාල්දි | 02 |
| 184. | කොරෝස් | 06 |
| 185. | තණ කොළ කපන මැෂින් තල | 01 |
| 186. | ලන්තෑරුම් | 09 |
| 187. | අලවංගු | 02 |
| 188. | ස්පෝට් ලයිට් | 06 |
| 189. | ස්ටෙපර් මැෂින් | 08 |
| 190. | වර්ණ රූපවාහිනී | 01 |
| 191. | ගැල්වනයිස් බාල්දි | 10 |
| 192. | කල්දේරම් අඟල් 12 | 03 |
| 193. | උදලු තල | 02 |
| 194. | හැලජන් ලාම්පු | 03 |
| 195. | යකඩ කුෂන් පුටු | 06 |
| 196. | බොයිලේරු | 01 |
| 197. | රේඩියෝ | 01 |
| 198. | වතුර පිල්ටර් | 01 |
| 199. | විදුලි කේතල | 01 |
| 200. | පිහිය | 02 |
| 201. | මැග් ටෝච් රදවන | 08 |
| 202. | වතුර බොයිලේරු | 04 |
| 203. | ඩ්‍රැගන් ලයිට් | 03 |
| 204. | විදුලි පන්දම් (විශේෂ) | 04 |
| 205. | සාමාන්‍ය විදුලි පන්දම් | 31 |
| 206. | පොරෝ තල | 01 |
| 207. | විසි කැති | 11 |
| 208. | ඇලුමිනියම් මුට්ටි | 06 |
| 209. | පිහිය වර්ග | 06 |
| 210. | වයර් කටර් | 02 |
| 211. | එල්ලයරින් | 05 |
| 212. | ඇලුමිනියම් වතුර ජොග්ගු | 17 |
| 213. | ගිනි නිවන උපකරණ | 01 |
| 214. | නිල ඇඳුම් රෙදි මීටර් (2006) | 310 |
| 215. | නිල ඇඳුම් රෙදි මීටර් (2007) | 100 |

09-660

---

**පොලිස් දෙපාර්තමේන්තුව - යාපනය කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ යාපනය කොට්ඨාසයට අයත් පොලිස් ස්ථානවල පාවිච්චිකර ගර්හිත කරන ලද භාවිතයට ගත නොහැකි මෙයට යා කර ඇති උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2014.09.23 වැනි දින පැය 10.30 ට යාපනය පොලිස් කාර්යාල සංකීර්ණයේ දී පැවැත්වේ.

2014.09.22 වැනි දින පැය 1300 සිට පැය 1600 දක්වා අදාල භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේ ම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතු ය. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ 2014 සැප්තැම්බර් මස 23 වැනි දින පැය 16.00 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු ය. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්ද්සියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
යාපනය කොට්ඨාසය.

2014 සැප්තැම්බර් මස 02 වැනි දින.

### උපලේඛණය

| අ. අ. | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය | ඒකක මිල | මුළු වටිනාතම |
|---|---|---|---|---|
| 01. | වෙස්ටින් | 50 | | |
| 02. | යකඩ පුටු | 40 | | |
| 03. | ශීතකරණ | 02 | | |
| 04. | වතුර පිල්ටර් | 19 | | |
| 05. | වතුර බොයිලේරු | 28 | | |
| 06. | යකඩ බාල්දි | 62 | | |
| 07. | වතුර මෝටර් | 12 | | |
| 08. | මල්ටිපොට් | 11 | | |
| 09. | කල්දේරම් ලොකු (ඇලුමිනියම්) | 17 | | |
| 10. | කල්දේරම් මධ්‍යම (ඇලුමිනියම්) | 62 | | |
| 11. | කල්දේරම් කුඩා (ඇලුමිනියම්) | 50 | | |
| 12. | හිරමන | 17 | | |
| 13. | ගෑස් ලිප් | 23 | | |
| 14. | නෑඹිලි | 06 | | |
| 15. | කුඩා තාච්චි | 13 | | |
| 16. | පොරෝ තල | 10 | | |
| 17. | උදලු තල | 11 | | |
| 18. | විසි කැති | 08 | | |
| 19. | විදුලි කේතල | 08 | | |
| 20. | විදුලි හිරමන | 03 | | |
| 21. | විල්බැරෝ | 10 | | |
| 22. | පිකස් | 01 | | |
| 23. | යතුරු ලියන සිංහල | 08 | | |
| 24. | යතුරු ලියන ඉංග්‍රීසි | 07 | | |
| 25. | ෆැක්ස් යන්ත්‍ර | 05 | | |
| 26. | රූපවාහිනී යන්ත්‍ර | 07 | | |
| 27. | රූපවාහිනී ඇන්ටනා | 02 | | |
| 28. | මේස විදුලි පංකා | 11 | | |
| 29. | සිටවන විදුලි පංකා | 13 | | |
| 30. | සිවිලින් විදුලි පංකා | 46 | | |
| 31. | කැසට් රේඩියෝ | 29 | | |
| 32. | රේඩියෝ | 05 | | |
| 33. | ඇලජන් ලාම්පු | 92 | | |
| 34. | විදුලි පන්දම් | 89 | | |
| 35. | පැටුල් මැච් | 17 | | |
| 36. | ලන්තෑරුම් | 14 | | |
| 37. | ෆෝග් ලයිට් | 02 | | |
| 38. | සර්ච් ලයිට් | 03 | | |
| 39. | මැග් ලයිට් | 10 | | |
| 40. | ශූගන් ලයිට් | 17 | | |
| 41. | පාපැදි | 42 | | |
| 42. | තණකොළ කපන යන්ත්‍ර | 01 | | |
| 43. | පාපැදි හුලන් පොම්ප | 09 | | |
| 44. | ලොකු පිහිය | 01 | | |
| 45. | පොඩි පිහි | 20 | | |
| 46. | ඇලුමිනියම් හට්ටි | 01 | | |
| 47. | හදිසි අවස්ථා ලාම්පු | 04 | | |
| 48. | මුද්‍රණ යන්ත්‍ර | 01 | | |
| 49. | බ්ලෙන්ඩර් | 01 | | |
| 50. | කොරස් | 07 | | |
| 51. | මේස පිහි | 04 | | |
| 52. | පාපැදි ලැගේජ් | 10 | | |
| 53. | පාපැදි ලොක් | 10 | | |
| 54. | පාපැදි සීට් | 11 | | |
| 55. | පාපැදි බෙල් | 10 | | |
| 56. | මේසන් හැදි | 03 | | |
| 57. | අධි ශීතකරණ | 04 | | |
| 58. | විදුලි ස්ත්‍රික්ක | 01 | | |
| 59. | රේක්ක | 06 | | |
| 60. | ගිනිනිවන උපකරණ | 01 | | |
| 61. | පාපැදි යතුරු | 07 | | |
| 62. | පත්වර් | 09 | | |
| 63. | ඇලුමිනියම් ජෝගු | 03 | | |
| 64. | මුල්ලු | 02 | | |
| 65. | ටකරන් තහඩු | 35 | | |
| 66. | සවල් | 08 | | |
| 67. | සෝදිසි ලාම්පු | 04 | | |
| 68. | කටර් අඩු | 07 | | |
| 69. | කැති තල | 02 | | |
| 70. | ඉබි යතුරු | 05 | | |
| 71. | ඇඳ ඉනිමන් | 06 | | |
| 72. | පිත්තල සීනු | 02 | | |
| 73. | ස්කුරුප්පු නියන් | 03 | | |
| 74. | තෙල් හැදි | 03 | | |
| 75. | කුඩා ගෑස් සිලින්ඩර් | 03 | | |
| 76. | අලවංගු | 01 | | |
| 77. | අත්කියත් | 01 | | |
| 78. | මැෂින් කියත් | 01 | | |
| 79. | වීඩියෝ කැමරා | 01. | | |

09-659

# රජයේ නොවන දැන්වීම්

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 5, නාරාහේන්පිට, කිරිමණ්ඩල මාවත, අංක 5 බී දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අ. 635464909 V හිමි තමරා රාණි චන්ද්‍රලේඛා පෙරේරා ජයවර්ධන වන මා විසින් රත්මලාන, ගාලු පාර, අංක 444/11 හි පදිංචි ජා. හැ. අ. 722552032 V හිමි අබ්දුල් අසීස් අබ්දුල් කරීම් මොහොමඩ් අෆ්සාල් යන අයට ලබා දී ඇති 2010.12.30 වැනි දින එම්. එස්. එම්. ෆාහිම් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 1086 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත්, මෙයින් දන්වා සිටිනු ලැබේ.

තමරා රාණි චන්ද්‍රලේඛා පෙරේරා ජයවර්ධන.

2014 ක් වූ අගෝස්තු මස 25 වැනි දින දී ය.

09-512

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහරගම, පමුණුව දේවාල පාර, අංක 148/1 හි පදිංචි තොටවත්ත දෝන මැනුවෙල් ගයා ගංගා තොටවත්ත (ජාතික හැඳුනුම්පත් අංක 727391045 වී) වන මා විසින් මහරගම, පමුණුව දේවාල පාර, අංක 148/1 හි පදිංචි අක්මීමන ආචාරිගේ චන්ද්‍රලතා (ජාතික හැඳුනුම්පත් අංක 485950575 වී) යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආරිෆප් මහතා විසින් වර්ෂ 2005ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින සහතික කරන ලද අංක 1168 දරන ඇටෝර්නි බලය අද පටන් (2014.08.22) අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට අක්මීමන ආචාරිගේ චන්ද්‍රලතා යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වගනොකියන බව මෙයින් දන්වා සිටිමි.

තොටවත්ත දෝන මැනුවෙල් ගයා ගංගා තොටවත්ත.

09-519

---

## විශේෂ ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීම

දෙහිවල, ෆෙයාර්ලයින් පාර, අංක 17 දරන ස්ථානයේ පදිංචි රණසිංහ ආරච්චිගේ රොෂාන් රණසිංහ (ජා. හැ. අ. 761660721 V ) වන මම මට එච්. එච්. නන්දන මල්කුමාර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2014.05.20 වැනි දින සහතික කළ අංක 620 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් දෙහිවල, ෆෙයාර් ලයින් පාර, අංක 17 දරන ස්ථානයේ පදිංචි රණසිංහ ආරච්චිගේ රංජිත් ගාමිණී ජයසිංහ යන අයට ලබා දෙන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියලු දෙනාම මෙයින් දැන ගත යුතුයි.

09-524

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2014 අගෝස්තු මස 19 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සී ගල්ෆ් යූ කේ (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 100361
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 60/6ඒ, 10 වැනි පටුමග,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

09-540

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : තොෂිගම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89959
ලියාපදිංචි කාර්යාලය : අංක 711, පොළ පාර, දුම්මලසූරිය
ලියාපදිංචි දිනය : 2012.12.14

චෝටර්ස් සෙකටේරියල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

09-541

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : නේච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 100049
සංස්ථාපන කළ දිනය : 2014.08.04
ලියාපදිංචි කාර්යාලය : අංක 385/4, "ලිබර්ටි නෙස්ට්" කොතලාවල,
කඩුවෙල.

සමාගමේ ලේකම්.

09-547

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සෙන්ට්. ඇන්ස් කෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 99953
සංස්ථාගත කළ දිනය : 2014.07.28
ලිපිනය : අංක 22, නොයෙස් පාර, හලාවත.

09-548

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඕපිර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100011
ලියාපදිංචි ලිපිනය : අංක 41 1/1, ග්‍රෙගරිස් රෝඩ්, කොළඹ 07.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පීවී 5958.

09-554

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මැදගම ග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100307
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පීවී 5958.

09-555

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 10, බෝධිරාජාරාම මාවත, අංක 765/433 හි පදිංචි සකලවල්ලි ආරච්චිගේ කුසුමාවතී වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. නැපට ආරච්චි මහත්මිය විසින් වර්ෂ 2012 ඔක්තෝබර් මස 16 වැනි දින ලියා සහතික කරන ලද අංක 1836 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 10, බෝධිරාජාරාම මාවත, අංක 765/433 හි පදිංචි නිහරේපොල මුදියන්සේලාගේ දිනුක රංගජීව යන අයට බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍ර පොත් 14 කාණ්ඩයේ 24 වන පත්‍රිරුවේ දිනපොත් අංක 4773 හා වර්ෂ 2012.12.24 දාතම යටතේ ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2014 අගෝස්තු මස 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට එකී ඇටෝර්නි බලකරු නිහරේපොල මුදියන්සේලාගේ දිනුක රංගජීව විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වගකියනු නොලැබෙන පරිදි අහෝසි කොට අවලංගු කර සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ලංකාවාසී ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සකලවල්ලි ආරච්චිගේ කුසුමාවතී.

2014 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-581

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ග්ලෝබල් ඒජන්ට්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2014.08.27
3. සමාගමේ අංකය : පී වී 100530
4. ලියාපදිංචි ලිපිනය : අංක 01, බර්ඩ් පෙදෙස, කිරුළපන, කොළඹ 06.

ලේකම්.

එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

09-587

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

(1) මහනුවර, නුගවෙල, කුරුණෑගල පාර, අංක 215/2 යන ලිපිනයේ පදිංචි ඉන්දීවර උදිත බණ්ඩාර ජයවර්ධන (ජා. හැ. අ. 783315394 V) වන මම මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. ඩබ්. ජී. කපිලරත්න බණ්ඩා මහතා විසින් ලියා සහතික කරන ලද අංක 216 සහ 2009 ජූලි මස 31 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මත මහනුවර, මහයියාව, කාටුපල්ලිය පාර, අංක 4 යන ලිපිනයේ පදිංචි මදම්පෙරුම ආරච්චිලාගේ සුදේශ් බණ්ඩාර මන්තිලක (ජා. හැ. අ. 781880191 V) යන අයට පවරා ඇති විශේෂ ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙන අතර ඔහු විසින් මින් ඉදිරියට මා වෙනුවෙන් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බවටත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ඉන්දීවර උදිත බණ්ඩාර ජයවර්ධන.

09-625

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ, මොලගොඩ (තැපැල්), ගල්පොල, අංක ඒ 47/1 දරන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ මනෝජ් ධර්මවර්ධන වන මා විසින්, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් බණ්ඩාර අලුත්වත්ත මහතා විසින් 2010ක් වූ ජනවාරි මස 22 වැනි දින ලියා සහතික කරන ලද ඌව සබරගමුව කලාප රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 5 වන කාණ්ඩයේ 104 වන පත්‍රිරුවේ දිනපොත් අංක 37 යටතේ ලියාපදිංචි කර ඇති අංක 5858 දරන ඇටර්නි බලපත්‍රය මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ, මොලගොඩ (තැපැල්) ගල්පොල, අංක ඒ 47/1 දරන ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ ධර්මවර්ධන රාලහාමි යන අයට පවරන ලද ඇටර්නි බලපත්‍රය 2014.08.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලබන බවත්, එකී ඇටෝර්නි බලකරු වන හේරත් මුදියන්සේලාගේ ධර්මවර්ධන රාලහාමි යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිට සිදුකරනු ලබන කිසිම ගණුදෙනුවකට හෝ කටයුත්තකට මා විසින් වගකියනු නොලබන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. මනෝජ් ධර්මවර්ධන.

2014ක් වූ අගෝස්තු මස 27 වැනි දින,
කෑගල්ලේ දී ය.

09 - 645

### ඇටර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

උඩවෙල, තාරන, වෙලන්කැලේ පදිංචි (1) උපාලි තිලකරත්න සහ (2) ප්‍රයදර්ශනී තිලකරත්න යන අප දෙදෙනා විසින් ඇමෙරිකා එක්සත් ජනපදයෙහි වොෂිංටන් ඩී. සී. හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙහි දෙවැනි ලේකම්, ප්‍රභාෂිනි පොන්නම්පෙරුම ඉදිරියේ දී සහතික කරන ලදුව, බක්මීප්පුව, බැල්ලරාවහි අකුරණ පේඩිගේ නිමල් වෙත ලබාදෙන ලද 2005 දෙසැම්බර් මස 27 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමු.

ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මාර්ගයෙන් ඔහු විසින් සිදුකරනු ලබන කිසියම් ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට අප කිසිදු ආකාරයකින් වගකීමක් නොදරන්නෙමු.

උපාලි තිලකරත්න සහ ප්‍රියදර්ශනී තිලකරත්න.

09-651

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව දැනුම් දීමයි.

සමාගමෙහි නාමය : කොටුගොඩ වලව්ව (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමෙහි අංකය : පී වී 99978
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47/4, සීඩබ්ලිව්ඩබ්ලිව් කන්නන්ගර මාවත, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2014 ජූලි 30

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී.

09-699

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙහි පහත සඳහන් ඇටෝර්නි බලපත්‍රයෙහි ඇටෝර්නි අධිපති වන පිළිමතලාව, ඉලුක්වත්ත, කොළඹ - නුවර පාර හි පදිංචි ගොඩගම විතානගේ උබේසේකර ගොඩගම සහ නුවර, ඇනිවත්ත බහිරවකන්ද පටුමග, අංක 139/3 හි පදිංචි ගොඩගම විතානගේ එඩ්මන් ගොඩගම යන අප විසින් අපගේ ඇටෝනි බලකරු ලෙස නුගේගොඩ, උඩහමුල්ල, පරණ කොට්ටාව පාර, අංක 486/7 හි පදිංචි රෝහිත කරුණාරත්න ගොඩගම හෙවත් ගොඩගම විතානගේ රෝහිත කරුණාරත්න ගොඩගම යන අය පත් කරමින් නාමලි ගුණරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කල අංක 3038 හා 2014.01.09 දින දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අංක III ඇටෝනි බලපත්‍ර පොතේ 704 කාණ්ඩයේ අංක 30 පත්‍රිරුවේ ලියා පදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රයෙන් අප විසින දෙන ලද ඇටෝනි බලය අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමු.

09-666

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලාෆ්ස් මැරිටයිම් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2014.08.26
සමාගමේ අංකය : පී වී 100480
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ආර්. ඒ ද මෙල් මාවත, කොළඹ 04

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

නීතිඥ කීර්ති පතිරාජ,
සමාගම් ලේකම්.

09-698

### මින් ලංකා කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2014 අගෝස්තු මස 21 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 100418 යටතේ මින් ලංකා කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2 එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය) හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු).
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 03.

09-578

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| 1. ද ෆොටෝ කියුබ් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 100353 | 2014.08.19 | අංක 54, ශ්‍රී ධම්මාධාර පාර, රත්මලාන |
| 2. ද ෆ්ලයිං ෆිෂ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 100471 | 2014.08.25 | අංක 67/2, ෆයිෆ් පාර, කොළඹ 05. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-668

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර

**රටබීම තැබෑරුම් සඳහා රේන්ද විකිණීම - 2015**

කොළඹ දිස්ත්‍රික්කය - මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුලුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද, සමග ටෙන්ඩර් පත්‍ර එවිය යුතු ය. එම වත්කම් සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය :-

*(ඒ)* ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
*(බී)* කොළඹ 02, ස්ටේපල් වීදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(සී)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයේ උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. "2015 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2014.11.03 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන්, සුරාබදු බලපත්‍ර කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසිදු හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම මොරටුව මහ නගර සභා, කොට්ඨාස අංක 9 හි පවත්වාගෙන යා යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| (ඒ) අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ප්‍රාදේශීය ප්‍රදේශයේ තැබෑරුම් අයත් විය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල (රු.) | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව | විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 9 කොට්ඨාසය මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 9 කොට්ඨාසයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2014.11.03 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්* . - 2014.11.03 වැනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 2014.11.17 වැනි දින පෙ.ව.10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. සී. නිරෝෂන්,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2014 අගෝස්තු මස 25 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

09-643

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ, කෝට්ටේ පාරේ පිහිටි වරිපනම් අංක 326 දරන වර්තමානයේ පිටකෝට්ටේ පිහිටි (කොට්ඨාස අංක 6), ශාන්ත තෝමස් දේවස්ථාන පරිශ්‍රය නමින් හැඳින්වෙන "මදටියගහවත්ත" හෙවත් "මාරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. කම්මානන්කඩ විසින් මැන සාදන ලද 2004 මාර්තු මස 21 දිනැති අංක 2959 දරන පිඹුරට අනුව ලොට් 07 දරන කැබැල්ල (බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් මැන සාදන ලද 1971 සැප්තැම්බර් මස 15 දිනැති අංක 1148 දරන පිඹුරේ දැක්වෙන ලොට් 07 දරන කැබැල්ලෙහි නැවත මැනුමක් වන) සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් ය.

විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 11.87

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද 2004 පෙබරවාරි මස 27 දිනැති අංක 626 සහ 2006 ජූනි මස 21 දිනැති අංක 1003 සහ 2008 මාර්තු මස 31 දිනැති අංක 1496 දරන උකස්කරයන් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චම්පා හපුහින්න විසින් ලියා සහතික කරන ලද 2011 ජූනි මස 10 දිනැති අංක 270 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදායි ලෙස අයි. සී. එම්. මයික්‍රෝ කොම්පියුටර් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.09.05 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, එදිනම ඩේයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - පිටකෝට්ටෙ හන්දියේ සිට කෝට්ටෙ දිශාවට කෝට්ටේ පාර දිගේ මීටර් 150 ක් පමණ දුර යන විට විෂය ගත දේපළ පාරේ වම් අත පැත්තේ ශාන්ත තෝමස් දේවස්ථානයට පෙර පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදල්වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුව හොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667109 ෆැක්ස් අංකය : 011- 2565573.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011 - 2873656, 0777 - 672082,
ෆැක්ස් අංකය : 011 - 2871184.

09-644

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

ඒ. පී. ඒ. රාජපක්ෂ
ගිණුම් අංක : 0071 5000 1441

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008.07.24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් හත් ලක්ෂ හතලිස් දෙදහස් පන්සිය පනස් අටයි ශත පනස් හතරක (රු. 37,42,558.54) මුදල ද, 2008 මැයි 08 වැනි දින සිට අංක 4150 දරන බැදුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් තුන් ලක්ෂ තිස් දහසක (රු. 33,30,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2008.09.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2008.09.05 වැනි දින "දිවයින" සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2014.10.16 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවත් තුළ පමුණුව ග්‍රාමයේ පිහිටි වනාත පාර (පමුණුව පාර) වරිපනම් අංක 51 දරන "කෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. යූ. එස්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 05 දාතම හා අංක 1323 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණයකොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර නැගෙනහිරට : වනාත පාර, දකුණට : පාර සහ බස්නාහිරට : වනාත පාර වරිපනම් අංක 51/1 A දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම දෙකයි අටක් (අ. 0 රූ. 0 පර්. 12.28) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 1323 දරන පිඹුරට අනුව ය.

අංක 1323 දරන පිඹුරේ එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

එකී පමුණුව ග්‍රාමයේ පිහිටි "කෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන යන අය විසින් සාදන ලද 1983 ජූනි 22 දාතම හා අංක 78 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : අඩි 10 පළල මාර්ග වෙන්කිරීම නැගෙනහිරට : වානත පාර, දකුණට : අංක 1384 දරන පිඹුරේ ලොට් B 11 (අඩි 10 පළල මාර්ග වෙන්කිරීම) සහ බස්නාහිරට : අංක 1384 දරන පිඹුරේ ලොට් B 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි හයක් (අ. 0 රූ. 0 පර්. 12.56) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 78 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 2983/19 යටතේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

බලයලත් මානක තැන සී. එච්. ජී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1980 සැප්තැම්බර් මස 10 දාතම හා අංක 1384 දරන පිඹුරේ ලොට් B 11.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

09-691

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්
කොමර්ෂල් හවුස්
අංක 21, බ්‍රිස්ටල් වීදිය,
තැ. පෙ. 856,
කොළඹ 01.

නඩු අංකය : HC (Civil)
248/2005 (1) ..................................පැමිණිලිකරු

*එදිරිව*

1. හයිග්‍රෝ ලංකා එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
"ශාන්ති" අරකාවිල,
හඳපාන්ගොඩ.

2. ආනන්ද කත්‍රිආරච්චි,
"ශාන්ති" අරකාවිල,
හඳපාන්ගොඩ.

...................................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමෙ ආඥාව වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 20 වැනි දින ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට එක්ව සහ/හෝ වෙන් වෙන්ව රුපියල් පනස් එක් ලක්ෂ හතලිස් දහස් පන්සිය විසි දෙකයි ශත අසූතුන (රු. 51,40,522.83) ක මුදලක් සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් එම රුපියල් පනස් එක් ලක්ෂ හතලිස් දහස් පන්සිය විසි දෙකයි ශත අසූතුන (රු. 5,140,522.83) මුදල මත වර්ෂ 2005ක් වූ ජූලි මස 01 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින එනම් වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 20 වැනි දින දක්වා වර්ෂයකට 26% බැගින් වන පොළිය සහ ඉන්පසු තීන්දු ප්‍රකාශයේ සමස්ත මුදල මත සම්පූර්ණයෙන් ම මුදල ගෙවා නිමවන තෙක් නෛතික පොළිය සහ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට අණකර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ ස්ථානය එම තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදල පොළිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා බැඳී ඇති බවටත්, එය ඇස්කිසි කළ හැකි බවට වැඩිදුරටත් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2007ක් වූ අගෝස්තු මස 20 වැනි දින කොළඹ දී පැවැත්වූ බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරුවන් අපොහොසත් ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ අරකාවිල, හඳපාන්ගොඩ යන ස්ථානයේ දී වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

